# කතුවැකිය

## වෛද්‍ය විද්‍යාවට විද්‍යාවේ දායාදය

විද්‍යාව හා තාක්ෂණය එහි අසමසමවූ ප්‍රගතියත් සමගම වෛද්‍ය විද්‍යාව ලබා ඇති දියුණුව පෘථිවිය මත වෙසෙන අප හැම කෙනෙකුගේම ජීවිත ස්පර්ශ කර ඇත්තේ දරුණු රෝග පීඩාවන්ට හරස් කපමින් පමණක් නොව දිගුකල් ජීවත්වීමට සලසන ජීවන රටාවන් පිළිබඳ පැහැදිලි මග පෙන්වීමක්ද කරමිනි.

මෙම තත්වයට මග සැලසූ ජයග්‍රහණ කිහිපයක් දෙසට ඔබ කඳවා ගෙන ගියහොත් **ප්‍රතිශක්තිකරණය** ලොවට හඳුන්වාදෙමින් **1796**දී **එඩ්වඩ් ජෙනර්** කළ මෙහෙවර සදානුස්මරණීයය. මේ වන විට මිනිසාට තර්ජනයක්ව තිබූ වසූරිය, පෝලියෝ, පිටගැස්ම ඇතුළු සංක්‍රාමීය රෝග ගණනාවක් අපෙන් සමුගෙන ඇත්තේ එමගිනි.

ශල්‍යකර්මයකදී **සිහිනැතිකිරීම සහ ප්‍රතිපූතික** ක්‍රමවේද නිසා රෝගියාට වේදනාව නොදැනෙන්නට ශල්‍යකර්මය සිදු කිරීමටත් එහි තුවාල පැසවීම වැළැක්වීමටත් හැකිවීම මහගු ඉදිරි පියවරකි. **1816** ඔක්තෝම්බර් **16** දින **විලියම් ටී. ජී. මෝර්ටන් විද්‍යාඥයා, ඊතර්** සතු විශ්ම බලය පෙන්වීම මෙහි මූලාරම්භය විය.

**1928** දී **ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් ෆ්ලෙමිං** පෙනිසිලින් සොයාගැනීමත් සමග ඇරඹුණු **ප්‍රති - ජීවක සහ ප්‍රති - වයිරසීය** යුගය අදත් තව තවත් ඉදිරියට ඇදෙනුයේ අකල් මරණයට පත්වීමට තිබූ වැඩිදෙනෙකුට ජීවත්වීමේ වාසනාව පවරමිනි. **උපත්පාලන පෙත්ත** (විසංග්‍රාහක) සිදු කරන සමාජයීය විප්ලවයද එසේමෙසේ නොවේ. එය රෝගයක් සුව කරන ඖෂධයක් නොවුනද ජීවන රටාව හැඩගස්වා මවුවරුන්ගේ සහ ළමයින්ගේ ජීවිත සුරකිමින් පෘථිවිය මිනිසුන් ගෙන් පිරී ඉතිරියාමට තිබූ අවස්ථාව වළකා ඇත.

**හෘද සැත්කම් සහ හෘද රෝගී සත්කාරයද** ඇතුළු **අවයව බද්ධය** හා අනෙකුත් රෝගී තත්වයන් පාලනයට ගෙන ඇති පියවර තුළින් මිනිස් ජීවිතවල වටිනාකම ඉහළ නංවා ඇත. අතිශය සංකීර්ණ, තාක්ෂණික ක්‍රියාවලි මෙම ජයග්‍රහණ 'මරණය', 'අමරණය' කිරීමේ හැකියාව ලඟා කර ඇති බව කෙනෙකුට තර්ක කළ හැකි තරමිය. ලෝකයේ **ප්‍රථම අවයව බද්ධය 1954** දී එක් නිවුන්නෙකුගෙන් අනෙක් නිවුන් අයට **වකුගඩුවක්** ලබාදීමෙන් ඇරඹී අතර **ප්‍රථම අක්මා බද්ධය 1967** දීත් **ප්‍රථම හෘදය බද්ධය 1968** දීත් සිදුකරනු ලැබීය.

කාන්තාවකගේ ජීවිතයේ බිහිසුණුම අභියෝගය දරු ප්‍රසූතිය ලෙස අතීතයේ දී පැවතියද, සිහිනැතිකිරීම, සිසේරියන් සැත්කම සහ විවිධ උපක්‍රම හේතුකොට එම බිය තවදුරටත් ඇත් කර ඇත. දරුපල නොමැති කාන්තාවකට නළ දරු උපතකට මග පෑදීමටද විද්‍යාව ප්‍රබලය. **එක්ස් රේ, සී.ටී, අල්ට්‍රා සවුන්ඩ්ස්, එම්. ආර්. අයි., පෙට්, ස්කෑන්** වැනි කිරණ ප්‍රතිබිම්බකරණයන් මෙතරම් දුරට මිනිස් ජීවිත සුරකිනු ඇතැයි **1800** ගණන්වල එක්ස් කිරණය ලොවට දායාද කළ **විල්හෙල්ම් රොන්(ට්)ජන්වත්** සිතන්නට නැත. මේ සියල්ල අද අප අත ඇත. හෙට........?

මානව ගෙනෝමය ඇතුළු ජාන විද්‍යාත්මක ගවේෂණ, පියවි සෛල පර්යේෂණ, මිනිස් සිත හා එහි ක්‍රියාකාරිත්වය ගැන කෙරෙන විමර්ශන, නැනෝ ඖෂධ භාවිතයෙන් සිදුකෙරෙන ඉලක්ක ගත ඖෂධ සැපයුම, සිරුර නොකපා සිදුකරන සැත්කම්, තොරතුරු තාක්ෂණයේ ඵල සෞඛ්‍යයට යොමු කරගැනීම ආදී දැනටමත් අර්ධ වශයෙන් සාර්ථකවී ඇති තවත් බොහෝ පියවර හෙට දවසේ සාර්ථක වනු නොඅනුමානය. එපමණක් නොව හෘදයාබාධ, ආඝාතය, දියවැඩියාව, අධික රුධිරපීඩනය, පර්වදාහය සහ පිළිකාව ඇතුළු මර උගුල්වල නොවැටී ජීවිතය හසුරුවන ජීවනරටාවක් කරා අප මෙහෙයවනු ඇත්තේ ද විද්‍යාව හා තාක්ෂණයය.

**තුසිත මලලසේකර**